## 2

# අහ්ලුස් සුන්නා වල් ජමාආ

إنَّ بَنِيْ إِسْرائيلَ قَدِ افْتَرَقُوا علي إِحْدَى وسَبْعِينَ فِرْقَةً وَتفْتَرِقُ أُمَّتِي على ثَلَاثٍ وَسَبْعِيْنَ فِرْقَةً كُلُّهَا فِي النَّارِ إِلَّا وَاحِدَةً فَقِيْلَ: مَا الْوَاحِدَةُ؟ قَالَ مَا أنَا عَلَيْهِ الْيَوْمَ وَأصْحَابِيْ – ابن ماجه

**බනු ඊස්රායීල්වරු කණ්ඩායම් 71කට බෙදුණහ. මගේ උම්මත්වරු කණ්ඩායම් 73කට බෙදෙති. එයින් එක් කණ්ඩායමක් හැර ඉතිරි සියල්ල නිරයට යන්නාහ. එම කණ්ඩායම කුමක් දැයි අසනු ලැබූවිට, මම සහ මගේ සහාබාවරු අද සිටින අයුරින් ම සිටින පිරිස යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පිළිතුරු දුන්හ. (ඉබ්නු මාජාහ්)**

"අහ්ලුස් සුන්නා වල්ජමාආ" යන පදය සහාබාවරුන්ගේ කාලයේ පටන් අද දක්වා මුස්ලිම් සමාජයේ භාවිත කෙරෙන්නේ ය. සුන්නාහ් යන පදය පරම්පරාව යන අර්ථයත් ජමාආ යන පදය බහුතරය යන අර්ථයත් ගෙන දෙන්නේ ය.

ඉස්ලාමීය ව්‍යවහාරයේ අහ්ලුස් සුන්නා වල් ජමාආ යනු, නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ද එතුමාගේ මිත්‍රවරුන් ද ජීවත් වූ ක්‍රමය අනුගමනය කිරීම වේ. මෙය හදීස් මඟින් තව දුරටත් ස්ථිර වේ.

මා ද මාගේ අනුගාමිකයන් ද සිටි මගෙහි සිටින්නෝ ස්වර්ගයට යන අය වෙති, යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූහ. මෙය අහ්ලුස් සුන්නා වල්ජමාආව පිළිබඳ වේ.

# අහ්ලුස් සුන්නා වල් ජමාආ අකීදවෙහි සාරාංශය

## 1. අල්ලාහ්

අල්ලාහ් සියල්ලෙහි මැවුම්කරුවා ය. ඔහුට ආරම්භයක් හෝ අවසානයක් නැත. සියල්ල කෙරෙහි බලය ඇත්තේ ය. ඔහු පරිපූර්ණ, සර්වඥ, සදා පවතින, සර්ව ශ්‍රාව්‍ය, සර්ව දෘෂ්ටික වූවෙකි. තව ද නැමදුමට සුදුස්සා ඔහු ය. ඔහු කිසිවෙකුගේ හා කිසිදෙයක අවශ්‍යතාවක් නොමැත. ඔහු පරම අසමසම වූවෙකි. ඔහු කිසිවක අරක් ගන්නේ නැත. තව ද ඔහු තවත් යමක් හා එක්වන්නේ හෝ ඒකාග්‍ර වන්නේ ද නැත. ඔහු පැතූ දේ සිදු වේ, නොපැතූ දේ නොසිදු වේ. "රිස්කය" ලබා දෙන්නේ ඔහු ම ය. රෝග නිවාරණය, දුක් කරදර නැති කරන්නේ ද ඔහුම ය. මුඃමින්වරු කියාමතයේ දී ඔහුව දැකීමේ භාග්‍ය ලබති.

" ඔහු යමක් සිතූ විට "කුන්" (සිදුවන්න), යන අණ පමණක් ප්‍රමාණවත් ය. එය සිදු වේ."

## 2. මැලක්වරු

අල්ලාහ් මැලක්වරු ආලෝකයෙන් මැව්වේ ය. ඔවුන්ගේ සංඛ්‍යාව දන්නේ අල්ලාහ් පමණි. ඔවුන් විවිධ කාර්යයන්හි යෙදී සිටිති. ඔවුනතුරින් ජිබ්රීල් අලෛහිස්සලාම් ප්‍රධාන ය. ඔවුන් අල්ලාහ්ගේ අණ පරිදි පූර්ණ යහපත සලසති. අල්ලාහ්ගේ මැවුම් අතර ෂයිතාන් හා ජින්වරු ද වේ.

## 3. අල් කුර්ආන්

අල් කුර්ආනය අල්ලාගේ කලාමය යි. මීට පෙර ද ඔහු ආගම් රැසක් පහළ කර මිනිසා යහමගට යොමු කළේ ය. අවසන් ආගමික ග්‍රන්ථය වන අල් කුර්ආන් පහළ වූ පසු පෙර පහළ කළ ආගමික කෘති අවලංගු විය. තව ද අල් කුර්ආනයේ ආරක්ෂාව සහතික කර ඇත්තේ අල්ලාහ් ය.

## 4.රිසාලාත්

මිනිසාට මගපෙන්වීම සඳහා කලින් කලට රසූල්වරුන් සහ නබිවරුන් පහළ කරනු ලැබීම සත්‍යයකි. මොවුන් මගින් ගැත්තන්ට යම් යම් දේ පැනවීමත් වැලැක්වීමත් කර ඇත. මොවුහු මුඃජිසාත් නැමැති ආශ්චර්ය පදමට හැකියාව ලැබූහ. මොවුහු ඉස්මත් යන ගුණය ලැබ පාපි ක්‍රියා කිරිමෙන් ආරක්ෂාව ලැබූ අය වෙති. මොවුහු සියල්ලෝ ම කිසි දු භේදයකින් තොර ව විශ්වාස කළ යුතු ය. මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා අවසන් නබිවරයා වශයෙන් පිළිගෙන කටයුතු කළ යුතු යි. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ පැමිණීමත් සමග රිසාලතය සම්පූර්ණ වන අතර ඉන් පසු ව කිසි දු නබි වරයකු හෝ රසූල් වරයකු පහළ කරනු ලබන්නේ නැත.

## 5. කියාමාව

මරණයෙන් මතු ජීවිතයක් ඇත. එය ආරම්භ වන්නේ මිනීවලේ (කබ්ර්) සිට ය. කබ්රයේ දී ප්‍රශ්න කිරීම සැබෑ ය. කියාමාවේ දී ප්‍රශ්න කිරීමක් ඇත. සිරාත්, මීසාන්, ස්වර්ගය, නිරය සත්‍ය ය. ඒවා ස්ථාවර ය. ඒවා මවනු ලැබ ඇත.

කියාමාවේ දී නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාට ද අන් නබිවරුන්ට ද, මලක්වරුන්ට, යහ ගැත්තන්ට ද, ෂෆාඅත් කළ හැකි ය. එය සිදු වනුයේ අල්ලාහ්ගේ අවසරය පරිදි ය.

## 6.සහාබාවරු

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ මිත්‍රවරුන් වන මොවුහු මුඃමින්වරුන් අතරින් උසස් අය වන්නාහ. ඔවුහු නබිවරුන්ට පසුව ඊළඟ ඉහළ මට්ටමේ සිටින අය වෙති. මොවුහු අතරින් දස දෙනකු ස්වර්ගය පිළිබඳ ශුභාරංචිය පැවසූ අය වන්නාහ. අහ්ලුල්බෙත් යන නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ පවුලේ අය කෙරෙහි හා නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාගේ මෙහෙසිවරු හා මුඃමින්වරුන්ගේ මව්වරුන් වන උම්මහාතුල් මුඃමිනීන්වරු කෙරෙහි ආදර කරුණාව දැක්වීම හා ගෞරවයෙන් සැලකීම අවශ්‍ය ය. සහාබාවරු, සියලුදෙනා ම විශ්වාසවන්ත හා අවංක වූ අය වෙති. ඔවුන්හට චෝදනා කිරීම හා විවේචනය  කිරීම පවකි.

## 7. පාපි ක්‍රියා

මහා පාපවල නියැලෙන මුස්ලිම් බැතිමතා පාපී පුද්ගලයෙකි. එහෙත් කාෆිර් නොවේ. ඔහු නිරයට ඇතුළු වුව ද ස්ථිර ව එහි රැඳෙන්නේ නැත. පාපි ක්‍රියාවල යෙදුණු මුඃමින් අල්ලාහ් කැමතිවූවා නම් සමාව දී ස්වර්ගයට ඇතුළු කරන්නේ ය. නැතහොත් දඬුවම් ලබා දී පසු ව ස්වර්ගයට ඇතුළත් කරන්නේ ය. කුෆ්රය හෝ ශිර්කය ඇති නොකරන ක්‍රියාවක නොයෙදෙන තත්ත්වයක සිටින මුස්ලිම් කෙනකු හට කාෆිර් යැයි කීම මහා පාපයකි. පාපී ක්‍රියාවක් පාපයක් නොවේ යැයි සැලකීමත් ෂරීආවට විහිළු කිරීමත් වැනි ඒවා කුෆ්රය ඇති කරන්නේ ය. ෂෆාඅතය යන්නක් ඇත. අල්ලාහ්ගේ අවසරය ලැබූ සමහරු, අන් අය සඳහා ෂාෆාඅත් කිරිමේ අවස්ථාව සලසා දී ඇත.

## 8. වලීවරු

වලීවරු දේව භක්තිකයන් ය. අල්ලාහ් කැමති අයට සුවිශේෂ වූ දයාද ලබා දෙන්නේ ය. වලීවරු සතුව කරාමත් යන ආශ්චර්ය ඇත. ඔවුන් කවර ආධ්‍යාත්මික තත්ත්වට පත් වුව ද මූලික ආගමික කටයුතුවලින් නිදහස් කරනු ලැබූ අය නොවේ.

අහ්ලුස්සුන්නා වල් ජමාආ,  අකීදවේ මූලික කරුණු කීපයක් සංෂිප්ත ව සලකා බැලුවෙමු. මේවා හැර  තවත් කරුණු කීපයක් ද දක්නට ඇත. ඒවා සියල්ල ජීවිතයේ දී අනුගමනය කිරීමෙන් දෙලොව  ජයගත හැක.

**පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන**

أَهْلُ السُّنَّة والجَمَاعَةِ ۞ السَلَفُ الصّالِحُ ۞ الْكُفْرُ ۞ النِّفَاقُ ۞ العَمَلُ
الكَافِرُ ۞ الأشْعَرِيَّةُ ۞ المَاتُرُودِيَّةُ ۞ الشَّفَاعَةُ ۞ الكَرَامَاتُ ۞ العَقِيْدَةُ

## අභ්‍යාසය

1. අහ්ලුස් සුන්නා වල් ජමාආ යන්නෙන් අදහස් කරන්නේ කවරහු දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
2. පහත දැක්වෙන කරුණු පිළිබඳ අහ්ලුස් සුන්නාහ් වල් ජමාආ වෙහි ස්ථාවරය  කෙටියෙන් පැහැදිලි කරන්න

(අ) මලක්වරු
(ආ) මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම්
(ඇ) පාපිෂ්ඨ ක්‍රියා
(ඈ) වලීවරු